# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1714/21 – 2011 ජූලි 15 වැනි සිකුරාදා – 2011.07.15

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

### ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)

5 වැනි වගන්තිය යටතේ ප්‍රකාශය

මෙහි පහත විස්තර කරනු ලැබූ ඉඩම පොදුජන කටයුත්තක් සඳහා අවශ්‍ය බවත්, එය ඉඩම් අත්කර ගැනීමේ පනතේ විධිවිධාන යටතේ අත්කර ගනු ලබන බවත්, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 5 වැනි වගන්තියේ (1) උප වගන්තිය යටතේ, ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍ය ජනක බණ්ඩාර තෙන්නකෝන් වන මම, මෙයින් ප්‍රකාශ කරමි.

කුරුණෑගල දිස්ත්‍රික්කයේ, කුරුණෑගල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, මහ ගල්ගොඩ මෙගොඩ කෝරලේ උතුර සුළු කොට්ඨාසයේ, හිදිර වලාන පහල ගමේ පිහිටි සර්වේයර් ජනරාල් විසින් 2008.09.29 දිනැතිව සකස් කර ඇති අංක කේයු/කේආර්එන්/2008/207 දරන ප්‍රගමන අනුරේඛනයේ කැබලි අක්ෂර 'අ' වශයෙන් පෙන්නුම් කර ඇති මුළු ප්‍රමාණයෙන් හෙක්. 0.5683 ක් පමණ වූ පහත සඳහන් මායිම් තුල පිහිටි ඉඩම් කොටස.

01. **කැබලි අක්ෂර 'අ' – පහල කඩේවත්ත – ප්‍රමාණය: හෙක්. 0.5683 ක් පමණ**

උතුරට: කේ. ජී. මුනිදාස සහ තවත් අය හිමිකම් කියන බෙල්ලන්වල කුඹුර සහ පිල්ලෑව; නැගෙනහිරට: එච්. කේ. හිල්ඩා සහ තවත් අය හිමිකම් කියන පහල කඩේවත්ත; දකුණට: මාර්ග (ප්‍රාදේශිය සභා); බටහිරට: මාර්ගය.

ජනක බණ්ඩාර තෙන්නකෝන්,
ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍ය.

යොමු අංකය: එල්ඩී/05/2007/ඩී/223.
2011 පෙබරවාරි මස 09 වැනි දින,
"ගොවිජන මන්දිරය",
රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

07 - 721

### ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)

5 වැනි වගන්තිය යටතේ ප්‍රකාශය

මෙහි පහත විස්තර කරනු ලැබූ ඉඩම පොදුජන කටයුත්තක් සඳහා අවශ්‍ය බවත්, එය ඉඩම් අත්කර ගැනීමේ පනතේ විධිවිධාන යටතේ අත්කර ගනු ලබන බවත්, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 5 වැනි වගන්තියේ (1) උප වගන්තිය යටතේ, ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍ය ජනක බණ්ඩාර තෙන්නකෝන් වන මම, මෙයින් ප්‍රකාශ කරමි.

දකුණු පළාතේ, හම්බන්තොට දිස්ත්‍රික්කයේ, වලස්මුල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, උතුරු ගිරුවා පත්තුව සුළු කොට්ඨාසයේ, වලස්මුල්ල (අ.ග.පි. 163) ගමේ පිහිටි ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරි විසින් පිළියෙල කරන ලද අංක එච්/ඩබ්එල්එස්/2010/34 හා 2010.03.04 දිනැති ප්‍රගමන අනුරේඛනයේ කැබලි අංක 1 වශයෙන් පෙන්නුම් කර ඇති ප්‍රමාණයෙන් හෙක්. 0.1518 ක් පමණ වූ දඹගහමුල්ල නමැති ඉඩම් කොටසට මායිම්.

උතුරට: මහජන පොළ පිහිටි භූමිය; නැගෙනහිරට: විල්මන් වීරසිංහ හිමිකම් කියන දඹගහමුල්ල ඉඩම; දකුණට: මාර්ගය (මා.සං.අ.); බටහිරට: ඇළ සහ මාර්ගය.

ජනක බණ්ඩාර තෙන්නකෝන්,
ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍ය.

යොමු අංකය: එල්ඩී/05/2009/යූඩීජ්/167.
2011 මැයි මස 13 වැනි දින,
"ගොවිජන මන්දිරය",
රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

07 - 723

1A – G 014796 – 360 (2011/07) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.